


# බයිබලය - අපගේ මගපෙන්වන්නා

ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයින්ට සරල ශුද්ධ ලියවිලි ඉගැන්වීම්

**The Bible Our Guide**

# බයිබලය - අපගේ මගපෙන්වන්නා

## ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයින්ට සරල ශුද්ධ ලියවිලි ඉගැන්වීම්

- ආර්. එස්. බිංග්ලි විසිනි -

# බයිබලය

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්,

යේසුස්වහන්සේ සහ අපෝස්තුළු වරුන්ගේ ශුද්ධ ලියවිලි විශ්වාස කල යුතු වෙමු:

යේසුස්වහන්සේ :-

"ශුද්ධ ලියවිලි ප්‍රතික්ෂේප කළ නොහැක". (යොහාන් 10:35)

පාවුල් :-

"දේවානුභාවයෙන් යුත් මුළු ශුද්ධ ලියවිල්ල ඉගැන්වීමටද, දුර්මත දුරු කිරීමටද, හික්මවීමටද, ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම පිණිසද, උපදෙස් දීමටද ප්‍රයෝජනවත් වෙයි". (2තිමෝති 3:16)

පේදුරු :-

"දිවැස් වැකියක් කිසි කලෙක මනුෂ්‍යය ප්‍රයත්නයකින් ඇති නොවීය. මනුෂ්‍යයෝ දේවානුභාවයෙන් පොළඹවනු ලැබ දෙවියන් වහන්සෙගේ වචනයෙන් කතා කලහ". (2පේදුරු 1:21)

පේදුරු :-

"ස්වර්ගයෙන් එවන ලද ශුද්ධාත්මයානන් කරනකොට ගෙන ඔබට සුභ අස්න දේශනා කළ තැනැත්තන් ලවා දැන් ඔබට ප්‍රකාශ කරන ලදි". (1පේදුරු 1:12)

**සත්‍ය විශ්වාසය පූර්ණ අනුග්‍රාහික බයිබලය මත පදනම් විය යුතුයි.**

බයිබලයෙහි නිරාගින්න, විනිශ්චයේ කාලයක දෙවියන්වහන්සේගේ දර්ශණයට අප්‍රියවූ සෑම දෙයෙහිම විනාශයයි. එය "සදාකාල ගින්න" සහ "ගිනිවිල" යනුවෙන්ද හඳුන්වනු ලැබේ.

## මිනිස් ස්වභාවය

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

ක්‍රිස්තුස්වහන්සේ තුල හැර අපේ ජීවිතය බලාපොරොත්තු රහිත පව්කාර සහ මියයන සුලු බැව් පිළිගත යුතු වෙමු:

මෝසෙස් :-

"නුඹ දූවිලිය. දූවිල්ලට හැරී යන්නෙහිය". (උත්පත්ති 3:19)

යෙසායා :-

"සකල මිනිස් වර්ගයා තණකොළ හා සමාන වෙති. ඔහුගේ සුන්දරත්‍වය වන මල් මෙන් පහව් යයි. තණකොළ වියලී යයි. මල් පරවෙයි". (යෙසායා 40:6-7)

යාකොබ් :-

"නුඹලාගේ ජීවිතය මොකක්ද? නුඹලා ස්වල්ප වේලාවක් පෙනී පසුව නොපෙනී යන මීදුමක්ය". (යාකොබ් 4:14)

පේදුරු :-

සියලු මිනිස් වර්ගයා තණපත් මෙනි. ඔවුන්ගේ සකල තේජස තණ මළ මෙනි. මල වැටී යයි. (1පේදුරු 1:24)

අප මියයන සුලු බව බයිබලය සරලව පැහැදිලි කරයි. මෙය පිළිගැනීමෙන් පමණක් අපට පිළිගන්වන ගැලවීම දෙස ඉදිරිය බැලිය හැක.

## ධර්මිෂ්ඨයන්ගේ අනාගතය

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

අපගේ ත්‍යාගය පෘතුවිය දෙසින් මිස ස්වර්ගය දෙසින් නොවන බව බලාපොරොත්තු විය යුතු වෙමු:

ගීතාවලිය :-
"මොලොක් ගුණ ඇත්තෝ දේශය උරුමකරගන්නෝය. ඔවුහු මහත් සමාදානයෙන් ප්‍රීතිමත් වන්නෝය". (ගීතාවලිය 37:11, මතෙව් 5:5)

යේසුස්වහන්සේ :-
"දෙවියන්වහන්සේට සේවය කරන පිණිස ඔබ ඔවුන් රාජකීය පූජක වංශයක් කළ සේක. ඔවුහු මිහිපිට රජකම් කරන්නාහ" (එළිදරව් 5:10)

දානියෙල් :-
"රූපයට ගැසූ ගලද මහත් කන්දක්වී මුළු පොළව එයින් පිරුණේය.... ඒ රජුන්ගේ දවස් වලදී ස්වර්ගයේ දෙවියන්වහන්සේ කිසි කලෙක නැති නොවන්නාවූ රාජ්‍යයක් පිහිටවන සේක". (දානියෙල් 2:35-44)

"මුලු අහස යට තිබෙන රාජ්‍ය වල රජකමද, ආන්ඩුවද, මහත්කමද මහෝත්තමයාණන්ගේ ශුද්ධවන්ත සෙනඟට දෙනවා ඇත" (දානියෙල් 7:27)

ගීතාවලිය :-
"ස්වර්ගය වනාහි ස්වාමින්ගේ ස්වර්ගය. නමුත් පොළව මනුෂ්‍ය පුත්‍රයන්ට දුන්සේක". (ගීතාවලිය 115:16)

යොහාන් :-
"ස්වර්ගයෙන් බැස වදාල මනුෂ්‍ය පුත්‍රයානන් හැර අන් කිසිවෙක් ස්වර්ගයට නොනැංගේය". (යොහාන් 3:13)

බයිබලය අපට පවසන්නේ ත්‍යාගය වර්තමානයේ ක්‍රිස්තුස්වහන්සේ සමග ස්වර්ගයේ වෙන්කර ඇති බවත්, උන්වහන්සෙගේ නැවත පැමිණීමේදී එය එළිදරව් වන බවත්ය.

පේදුරු :-
"අජරාමරවූද , නොමැලවෙන්නාවූද, ඒ උරුමය ස්වර්ගයෙහි ඔබ උදෙසා තබා ඇත. විමුක්තිදායක අරමුණ එළිදරව් කරන්න අන්තිම කාලයේ උන්වහන්සේ ඔබ ගලවන සේක. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශ වීමේදී ඔබ වෙත පැමිණෙන්නට තිබෙන වරප්‍රසාද පිට ඔබගේ බලාපොරොත්තුව සම්පූර්ණ ලෙස පිහිටුවන්න". (1පේදුරු 1:4,5,13)

පාවුල් :-

"අපි ස්වර්ගයේ පුරවැසියෝ වම්හ. දැනට අපට ඇති දුබල ශරීර, තමන්වහන්සෙගේ තේජාන්විත ශරීරයට සමාන වන පිණිස වෙනස් කරන සේක". (පිලිප්පි 3:20,21)

පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ මනුෂ්‍යයා පිහිටවූ පෘතුවිය, උන්වහන්සේ මතු ආශිර්වාද ලබාගන්නාවූ ස්ථානය බව බයිබලය අපට පවසයි.

## මළවුන්ගේ ස්වභාවය

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

සොහොන වනාහි නැගිටීමෙන් පමණක් අවසන් කළ හැකි අවිඥ්ඥානාත්මක ස්ථානයක් බව වටහාගත යුතු වෙමු.

ගීතාවලිය :-

"මරණයේදී නුඹ සිහිකිරීමක් නැත. සොහොනේදී නුඹට ස්තුතිය දෙන්නේ කවුද? (ගීතාවලිය 6:5)

හෙසකියා :-

"ඔබට ප්‍රශංසා කරන්නට පාතාල ලෝකයේ කිසිවෙකුට නොහැක. ඔබ කෙරෙහි විශ්වාස කරන්න මළගියවුන්ට නොහැක". (යෙසායා 38:18)

පේදුරු :-

"දාවිත් මළ බවත්, තැන්පත් කරනු ලැබූ බවත් නොවලහා කියමි. ඔහුගේ සොහොන අද දක්වා අප අතර ඇත.
(ක්‍රියා 2:29-34)

පාවුල් :-

"ක්‍රිස්තුස්වහන්සේ උත්තාන කරනු නොලැබූයේ නම් ඔබගේ ඇදහිම නිරර්ථකය. ඔබ තවමත් පාපයේ ඇලී සිටින්නහුය. එපමණක් නොව, ක්‍රිස්තුස්වහන්සේ අදහන මියගිය අයද සදහටම විනාශවී ඇත.

ක්‍රිස්තුස්වහන්සේ තුළ අපේ බලාපොරොත්තුව මේ ජීවිතයට පමණක් සීමා වුවක් නම්, අපි සියල්ලන්ටම වඩා කාලකන්නියෝ වෙමු". (1කොරින්ති 15:17-19)

පැරණි ගිවිසුමේ සොහොන සහ නිරය, එකම වචනය සහ එකම ස්ථානය විය. සියලුම මියගියවුන් යායුතු වූයේ මෙම ස්ථානයටය.

## පෘතුවියට ක්‍රිස්තුස්වහන්සෙගේ නැවත පැමිණීම.

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්
උන්වහනසේගේ දෙවැනි පැමිණීම දෙය උන්වහන්සෙගේ මුල් ගෝලයන් සමග බලා සිටිය යුතු වෙමු.

යේසුස්වහන්සේ :-

"මනුෂ්‍ය පුත්‍රයා ඔහුගේ සියලු ශුද්ධ දේවදූතයන් සමග මහිමයෙන් යුතුව එන්නේය". (මතෙව් 25:31)

දේවදූතයෝ :-

"නුඹලා අතරින් ස්වර්ගයට ඔසවාගනු ලැබූ යේසුස්, එසේම ඔහු ස්වර්ගයට යනු දුටුසේම ආපසු එන්නේය". (ක්‍රියා 1:11)

පේදුරු :-

"ඔබ උදෙසා පෙර නියම කරන ලද ක්‍රිස්තුස් නම් යේසුස්වහන්සේ ඒවා වදාරන පිණිස". (ක්‍රියා 3:20)

පාවුල් :-

"ස්වාමින්වහන්සේම අණදීමේ ශබ්දයද, අග්‍ර දේවදූතයකුගේ හඬද, දෙවියන් වහන්සෙගේ හොරණෑ නාදයද ඇතිව ස්වර්ගයෙන් බැස වදාරන සේක". (1තෙසලෝනික 4:16)

ඔහු කලින් පැමිණි විට ආරම්භ කල කටයුතු අවසන් කිරීමට හැකි වන්නේ ක්‍රිස්තුස්වහන්සෙගේ දෙවන පැමිණීමෙන් පමණි.

## යේසුස්වහන්සේ රජුය

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔහුගේ දෙවැනි පැමිණීමේදී මුළු පෘතුවියටම රජු බව සහතිකව දැකිය යුතු වෙමු:

ගාබ්‍රියෙල් දේවදූතයා :-

"උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක. පරමෝත්තමයානන්ගේ පුත්‍රයාණන් කියනු ලබන සේක. උන්වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙවිස්වාමින් වහන්සේ උන්වහන්සේට ප්‍රදානය කරන සේක. උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදහටම රජකම් කරන සේක. උන්වහන්සෙගේ රාජ්‍යය කෙලවරක් නොමැත්තේය". (ලූක් 1:32,33)

යේසුස්වහන්සේ :-

"යෙරුසලෙම මහ රජුගේ රාජධානිය බැවින්..... ඒ නමින් නොදිවිරන්න". (මතෙව් 5:34-35)

යෙරමියා :-

"ස්වාමින් වන මම මෙසේ වදාරමි: දාවිත්ගේ පෙලපතින් දැහැමි රජ කෙනෙකු නැගී එන කාලය පැමිණෙන්නේය. එතුමානන් නැණ නුවනින් රජකම් කරමින්, දැහැමි කමත්, යුක්තියත් දේශය මුළුල්ලේ ඉටු කරනු ඇත. එතුමානන්ගේ රජ දවස යුදා ගලවාගනු ලබන්නෝය. ඊශ්‍රායෙල්වරු සුරැකිව වසන්නෝය. "අපේ දැහැමිතාවය" යන්නෙන් එතුමාණෝ නම් කරනු ලබන්නාහ". (යෙරමියා 23:5-6)

සෙකරියා :-

"ඒ දිනවලදී ඔලිව කන්ද මත සමිඳාණෝ වැඩ සිටින සේක. එකල සමිඳාණන් මුලු ලෝකයේ රජතුමාණෝ වන සේක. එකම නමකින් උන්වහන්සේ හඳුන්වනු ලබන සේක. (සෙකරියා 14:4-9)

පාවුල් :-

"දෙවියන්වහන්සේ ඔහු විසින් පත්කල මිනිසා මගින් ලොව විනිශ්චය කරන දිනයක් නියමකර ඇත්තේය. උන්වහන්සේ ඒ මනුෂ්‍යයා මළවුන්ගෙන් උත්ථානය කිරීමෙන් සියල්ලන්ට සහතිකයක්දී ඇත". (ක්‍රියා 17:31)

මුළු පෘතුවිය දෙවියන්ගේ මහිමයෙන් උන්වහන්සේට පිරවිය හැක්කේ, මුලු පෘතුවියම යේසුස්වහන්සෙගේ ධර්මිෂ්ඨ පාලනයෙන් යුතු විටදිය.

## දෙවියන්ගේ රාජ්‍යය

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

පෘතුවිය පුරා දෙවියන්වහන්සෙගේ රාජ්‍යයේ බලය ස්ථාපිතවීම උදෙසා දැනුමෙන් ප්‍රීතිමත් වියු යුතු වෙමු.

දානියෙල් :-

"මේ රජුන්ගේ කාලයේදී ස්වර්ගයේ දෙවියන්වහන්සේ විනාශ කළ නොහැකි රාජ්‍යයක් පිහිටුවනු ලබන්නේය. එම රාජ්‍යය වෙනත් ජාතියකට අතහරිනු නොලබන්නේය. එය සියලු රාජ්‍යයන් පොඩිකර දවා දමන්නේය. එය සදාකාලෙටම පවතින්නේය". (දානියෙල් 2:44)

යේසුස්වහන්සේ :-

"මේ ලෝකයේ රාජ්‍යයන් අපගේ ස්වාමින්ගෙත් ක්‍රිස්තුස්වහන්සෙගේ රාජ්‍යයන් වන්නෝය. ඔහු සදාකාලයම පාලනය කරන්නේය... වැඩ සිටින, වැඩ සිටිය සර්වපරාක්‍රම දෙවි ස්වාමින්වහන්ස, ඔබගේ අති මහත් බලය පෙන්වා රජකම් කල බැවින් අපි ඔබට ස්තුති කරමු". (එළිදරව් 11:15-17)

දෙවියන්වහන්සේ සත්‍යවශයෙන්ම උන්වහන්සෙගේ විශ්වයේ පාලකයාණෝය.

ගීතාවලිය :-

"ස්වාමින්වහන්සේ තම සිංහාසනය ස්වර්ගයේ පිහිටෙවූ සේක. උන්වහන්සෙගේ රාජ්‍යයද සියල්ල කෙරෙහි බල පවත්වයි". (ගීතාවලිය 103:19)

දානියෙල් :-

"මනුෂ්‍යයන්ගේ රාජ්‍යය මහෝත්මයානන් පාලනය කරන බවත්, තමන් කැමති කෙනෙකුට එය දෙන බවත්... එතුමාණන්ගේ පාලනය සදාතනිකය, රාජ්‍යය පරපුරෙන් පරපුරටය".
(දානියෙල් 4:25,34)

වරක් ඔහුගේ රාජ්‍යය ඊශ්‍රායෙල්හි පිහිටුවීය. තම ජනතාවගේ නපුරුකම් නිසා එය ඉවත් කරගන්නා ලදී.

මෝසෙස් :-

"නුඹලා සැබවින්ම මාගේ හඬට කීකරුව මාගේ ගිවිසුම රක්ෂා කරන්නහු නම්.... නුඹලා මට පූජක රාජ්‍යයක් සහ ශුද්ධ ජාතියක් වන්නහුය". (නික්මයාම 19:5,6)

දාවිත් :-

අපේ පියවූ ඊශ්‍රායෙල්හි දෙවිවූ ස්වාමින්වහන්ස ඔබට සාදාකාලයට ප්‍රශංසා වේවා. මහෝත්මයද, පරාක්‍රමයද, තේජසද, ජයද, මහිමයද අයත් ඔබටය ස්වර්ගයෙහිත් පොළවෙහිත් ඇති සියල්ල ඔබගේය.

රාජ්‍යයත් ස්වාමීන්වහන්ස ඔබට අයිතිය ඔබ සියල්ල කෙරෙහි හිසමෙන් උසස්ව සිටින සේක... එවිට සලමොන් තමාගේ පියවූ දාවිත් වෙනුවට රජව ස්වාමීන්වහන්සෙගේ සිංහාසනයෙහි හිඳ සවිලවුනේය". (1ලේකම් 29:10,11,23)

එසකියෙල් :-

"දුෂ්ඨවූ ඊශ්‍රායෙල් අධිපතිය, නුඹේ කාලය අන්තිම අයුතුකමේ කාලයෙහි පැමිණ තිබේ. ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියනසේක. කිරීටය ගලවා දමන්න. ඔටුන්න අහක් කරපන්න.... පෙරළාදමන්නෙමි, පෙරළාදමන්නෙමි, අයිතිවාසිය ඇති තැනැත්තා එනතුරු එය තවත් නොවන්නේය. මම එය ඔහුට දෙන්නෙමි". (එසකියෙල් 21:25-27)

යෙසුස්වහන්සේ රාජ්‍යය නැවත පිහිටවූ විට, කැරලිකාර ඊශ්‍රායෙල් මනස්තාප විය යුතුය. එසේ නොවන්නන් ප්‍රතික්ශේප කෙරේ.

සෙකරියා :-

"ඔවුන් තමුන් විසින් ඇන්නාවූ තැනැත්තා වන මා දෙස බලා සිට එකම පුත්‍රයෙකු ගැන වැලපෙන්නාක් මෙන් උන්වහන්සේ ගැන වැලපෙනවා ඇත". (සෙකරියා 12:10 එළිදරව් 1:7 බලන්න)

යේසුස්වහන්සේ :-

"ආබ්‍රහම්ද, ඊසාක්ද, යාකොබ්ද සියලු අනාගත වක්තෘවරුන්ද දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ සිටිනවාත්, නුඹලාම පිටත දමනු ලබනවාත් නුඹලා දකින කල එහි හැඬීමත් දත්මිටිකෑමත් වන්නේය". (ලූක් 13:28)

යේසුස්වහන්සේ ජාතින් යටත්කර ඔහුගේ රාජ්‍යය පිහිටුවන්නේය. තවදුරටත් ඔහු කුරුසියේ ඇණගැසූ ජාතියේ අවනතවීම අවශ්‍යය වනු ඇත.

# පාපයේ උපත

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

මිනිස් හදවතින් පාපය පැන නගින බවත් දෙවියන්වහන්සේට එරෙහි සතුරා "යක්ෂයා" මිනිස් සංහතිය තුල හමුවිය හැකි බවත් පිළිගත යුතු වෙමු:

යොරමියා ෑ

"සියල්ලටම වඩා සිත රැවටිලිකාරව තිබේ. එය දුෂ්ඨවම තිබේ". (යෙරමියා 17ෑ9)

යාකොබ් ෑ-

"නමුත් එක එක මනුෂ්‍යයා තම තමාගේ තෘෂ්ණාවෙන් අඳිනු ලබන කල්හිද පොළඹවනු ලබන කල්හිද පරික්ෂා කරනු ලබයි". (යාකොබ් 1/14)

හෙබ්‍රෙව් ෑ-

"එහෙයින් දරුවන් ලේ හා මාංශයට පංගුකාරයන්ව සිටින නිසා උන්වහන්සේ එම ආකාරයෙන් ඒවාට පංගුකාරයෙක් වූ සේක. එසේ කළේ මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයාව මරණය කරනකොට ගෙන බල නැති කොට" "තමන්ම පූජා කිරීම කරණකොට ගෙන පාපය පහ කරන පිණිස උන්වහන්සේ කාලයන්ගේ කෙළවරදී එක් වරක් ප්‍රකාශවූ සේක." (හෙබ්‍රෙව් 2ෑ24, 9ෑ26)

යේසුස්වහන්සේ ෑ-

"මක්නිසාද ඇතුලතින් එනම් මනුෂ්‍යයන්ගේ සිතෙන් නපුරු සිතිවිලි, වෙශ්‍යාකම්, සොරකම්, මිනීමැරීම්, කාමමිථ්‍යාචාරකම්, තණ්හා, දුෂ්ඨකම්, වංචාව, සල්ලාලකම, ඊර්ෂ්‍යාව, අපහාස කිරීම, උඩඟුකම සහ මෝඩකම නික්මෙයි. මේ සියලු නපුරු දේ ඇතුලතින් නික්ම මනුෂ්‍යයා අපවිත්‍ර කෙරේ" (මාර්ක් 7ෑ21-23)

පාවුල් :-

"ඉදින් මාංශයේ ක්‍රියා ප්‍රකාශව තිබේ. එනම්, වෛශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූපවැඳීම, මායාව, සොරකම, විවාදය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධ, පක්ෂවාදීකම්, භේද, ලබ්ධි භේද, වෛර, බීමත්කම, මංගල්‍ය ඝෝෂා සහ තවත් එවැනි දේය. මෙබඳු දේ කරන්නට දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව මම නුඹලාට කියමි" (ගලාති 5:16-21)

මිනිස් පාපස්වභාවයේ සම්භවය ඒදන්හිදී මිනිසාගේ වැටීම දෙසට බයිබලය පෙන්වන අතර, මෙම "යක්ෂයා" විනාශ කළ හැක්කේ කුරුසිය මත යේසුස්වහන්සේ කල ගලවාගැනීමේ ක්‍රියාව තුලින් පමණි.

<u>දෙවියන්වහන්සේ යේසුස්ක්‍රිස්තුස්වහන්සේ සහ ශුද්ධාත්මය</u>

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්,

අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේ සමග පියාණන්වූ දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිගත යුතු වෙමු. ශුද්ධාත්මය තුළ උන්වහන්සේගේ කීකරු පුත්‍රයා දැකිය යුතු වෙමු. ශුද්ධාත්මය තුළ උන්වහන්සේගේ පෞද්ගලික බලය දැකිය යුතු වෙමු.

පාවුල් :-

"ඇත්තේ එක දෙවිකෙනෙක් සහ දෙවියන්ටත් මනුෂ්‍යන්ටත් අතරේ එක මැදිහත්කාර කෙනෙකුත්ය... මනුෂ්‍යයාවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේය". (1තිමෝති 2:5)

"ක්‍රිස්තුස්වහන්සෙගේ හිස දෙවියන්වහන්සේය".
(1කොරින්ති 11:3)

"තවද සියල්ල උන්වහන්සේට යටත් කරනු ලැබුවාම දෙවියන් වහන්සේ සියල්ලන් තුළ සියල්ල වන පිණිස පුත්‍රයානන් වහන්සේත් තමන්ට සියල්ල යටත් කළ තැනන්වහන්සේට යටත්වන සේක". (1කොරින්ති 15:28)

"නුඹලාගේ කැඳවීම එක බලාපොරොත්තුවට නුඹලා කැඳවනු ලැබූ ලෙසම ඇත්තේ එක ශරීරයත් එක ආත්මයාණන්වහන්සේත්, එක ස්වාමීන්වහන්සේත්, එක ඇදහිල්ලත්, එක බෞතිස්මයත්, සියල්ලන් කෙරෙහිද, සියල්ලන් කරණකොටගෙනද, සියල්ලන් තුළද පවතින්නාවූ, සියල්ලන්ට එකම පියවූ දෙවියන්වහන්සේත්ය". (එපීස 4:4-6)

යේසුස්වහන්සේ :-

"පියාණන්වහන්සේ මට වඩා උතුම්ය". (යොහාන්14:28)

"පියාණන්වහන්සේ යමක් කරනවා පුත්‍රයා දකින්නේද ඒ දේ මිස තනියම කිසිවක් කරන්ට ඔහුට බැරිය". (යොහාන් 5:19)

"මම මාගේ පියාණන්වහන්සේගේ ආඥා රක්ෂාකොට උන්වහන්සේගේ ප්‍රේමයෙහි යම්සේ පවතිම්ද, එසේම නුඹලාත් මාගේ ආඥා රක්ෂා කරවු නම් මාගේ ප්‍රේමයේ පවතින්නාහුය". (යොහාන් 15:10)

"එසේවී නමුත්, මගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා". (ලූක් 22:42)

ගාබ්‍රියල් දේවදූතයා :-

"ශුද්ධාත්මයාණන් නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ ආනුභාවයද නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්නට සිටින තැනැත්තේ ශුද්ධය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක". (ලූක් 1:35)

පේදුරු :-

"මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොළඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථා කළෝය".

"දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද, බලයෙන්ද, නාසරීය යේසුස්වහන්සේ ආලේප කළ සේක". (ක්‍රියා 10:38)

බයිබලය සෑම දෙයම දෙවියන් වෙතට යොමු කරයි. එනම් පියාණන් වෙතට: එය යේසුස්වහන්සේ තුල දෙවියන්ගේ සියලූ අභිප්‍රායන් මධ්‍යගත කරයි. එනම් පුත්‍රයාණන්: එය දිවැස්වරු, අපෝස්තුළු වරු සහ සාන්තුවරුන් අතර දෙවියන්වහන්සේගේම බලයෙන් ක්‍රියා කිරීම එලිදරව් කරයි. එනම් ශුද්ධාත්මය.

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ විශ්වාසය

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්
යේසුස් තුළ විශ්වාසය අත්‍යාවශ්‍යය බව දැනගත යුතු වෙමු. ක්‍රිස්තුස්වහන්සේට අයත් වන්නට පෙර ක්‍රිස්තියානි කාරයකු සත්‍ය සුභාරංචිය පිළිගත යුතුයඃ

යේසුස්වහන්සේ ඃ-
"දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සෑමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය". (යොහාන් 3:16)

"ඒ මම යැයි නුඹලා විශ්වාස කලොත් මිස නැත්නම් නුඹලාගේ පාපවල නුඹලා මැරෙන්නහුය". (යොහාන් 8:24)

පාවුල් ඃ-
"අදහන්නාවූ සියල්ලන්ටම (ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය) එනම් පළමුකොට යුදෙව්වාටද, එසේම ග්‍රීකයාටද, ගැලවීම පිණිස දෙවියන් වහන්සේගේ බලයය". "යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේ යැයි නුඹේ මුඛය ප්‍රකාශ කරන්නේ නම්, දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ බවත් සිතින් අදහන්නේ නම්, නුඹ ගලවනු ලබන්නෙහිය". (රෝම 1:16,10:9)

හෙබ්‍රෙව් :-

"ඇදහිල්ල නැතුව උන්වහන්සේව ප්‍රසන්න කරන්න නුපුළුවන. මක්නිසාද දෙවියනවහන්සේ වෙතට ළඟාවෙන්නා විසින් උන්වහන්සේ විද්‍යාමාන බවත් උන්වහන්සේ සොයන්නන්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කරන්ට ඕනෑය (හෙබ්‍රෙව් 11:6)මිත්‍යා ඉගැන්වීම් වලට එරෙහි අවවාදයක් වශයෙන් :-

පාවුල් :-

"අප විසින් නුඹලාට ප්‍රකාශ කරන ලද සුභාරංචිය හැර වෙන සුභාරංචියක් අපවත් ස්වර්ගයෙන් දේවදූතයෙක්වත් නුඹලාට ප්‍රකාශ කරතොත් ඔහු ශාප ලද්දෙක් වේවා".
(ගලාති 1:8)

බහුජන මතය අනුගමනය කිරීමට එරෙහිව :-

යේසුස්වහන්සේ :-

"පටු දොරටුවෙන් ඇතුල්වෙයල්ලා. මක්නිසාද විනාශයට යන දොරටුව විශාලය, පාරත් පළලය. එයින් ඇතුල්වෙන්නෝද බොහෝය. මක්නිසාද ජීවනයට යන දොරටුව පටුය. පාර අවහිරය. ඒක සම්බවන්නේ ස්වල්ප දෙනෙකුටය".
(මතෙව් 7:13,14)

ගැලවීම දැනටමත් ලැබී ඇති බැව් සිතීමට බයිබලය ඉඩ නොහරියි. පවුකාරයන්ට ඇති එකම මාර්ගය නම්, උන්වහන්සේ තුළ විශ්වාසය තබමින්, උන්වහන්සේ ගෞරව කළ දේව වචනය විශ්වාස කරමින්, යේසුස්වහන්සේ පෙරමුණ ගත් මාර්ගය කීකරුව අනුගමනය කිරීමයි.

## කුරුසිය දරා ගැනීම.

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

අපගේ මාංශමය ස්වභාවයේ දුර්වලකම් සහ උඩඟුකම් ඉවතලා, යේසුස්වහන්සේගේ කුරුසියේ මරණය ආකාරයට ඉවතහල යුතු වෙමු:

යේසුස්වහන්සේ :-

"යමෙක් මා පස්සේ එන්න කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන මා අනුව ඒවා".
(මතෙව් 16:24)

පාවුල් :-

"යේසුස්වහන්සේ තුළ තිබුනු සිතම නුඹලා තුලත් තිබේවා. උන්වහන්සේ.... දාසයෙකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණිසේක. මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත්, මරණය, එසේය, කුරුසියේ මරණය දක්වා කීකරුවූ සේක. එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස් කොට, සියලු නාම වලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන් සේක".
(පිලිප්පි 2:5-11)

"අපි පාපයට සේවය නොකරන ලෙස පාප ශරීරය නැතිවන පිණිස, අපේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසන ලද බව දනිමු". (රෝම 6:6)

"මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේ වී නමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත් වන සේක. තවද මා දැන් මාංශයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළාවූ, මා උදෙසා තමන්ම පාවා දුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි".

"ක්‍රිස්තුස්වහන්සේට අයිති තැනැත්තෝ මාංසය එහි ආශා සහ තෘෂ්ණා සමග කුරුසියෙහි ඇණගැසුවෝය".

"ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය ගැන මිස වෙන කිසි දෙයක් ගැන පාරට්ටු කර ගන්නට මට නම් සිද්ධ නොවේවා, ඒ කරණකොටගෙන ලෝකය මටද, මා ලෝකයටද කුරුසියෙහි ඇණගසනු ලද්දේ විය". (ගලාති 2:20, 5:24, 6:14)

යේසුස්වහන්සේ :-

"ඔවුහු තමන්ගේ සළු බැටළුවාණන්ගේ ලෙයින් සෝදා සුදු කරගත්තෝය". (එළිදරව් 7:14)උන්වහන්සේගේ කුරුසියේ මරණින්, යේසුස්වහන්සේ පාපයේ බලය විනාශ කළ අතර, දැන් සර්ව සම්පූර්ණ සහ අමරණීයය. ක්‍රිස්තුස්වහන්සේ සමග තමන්ගේ පැරණි ජීවන ක්‍රමය කුරුසිගත කර උන්වහන්සේ අනුගමනය කිරීමට සොයන්නන් හට, එම පරමාර්ථයටම උන්වහන්සේගෙන් උපකාර ලැබෙනවා ඇත.

## සත්‍ය බෞතිස්මය

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

අපගේ විශ්වාසය අනුගමනය කර බෞතිස්මය ලැබීමේ යේසුස්වහන්සේගේ අණට කීකරු විය යුතු බව වටහා ගන්නෙමු.

යේසුස්වහන්සේ :-

"දැනට ඉඩ හරින්න. මක්නිසාද, මෙසේ සියලු ධර්මිෂ්ඨකම් සම්පූර්ණ කරන්නට අපට සුදුසුය.... යේසුස්වහන්සේ බෞතිස්ම ලැබූ එකෙණෙහිම දියෙන් ගොඩනැගුණු සේක.... මොහු මාගේ ප්‍රෙමවන්ත පුත්‍රයාය, මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි අහසෙන් හඬක් විය".
(මතෙව් 3:15-17)

"අදහන්නාවූ බෞතිස්මය ලබන්නාවූ තැනැත්තේ ගලවනු ලබන්නේය, නමුත් අදහ නොගන්න තැනැත්තේ වරදට පත්කරනු ලබන්නේය". (මාර්ක් 16:16)

"යමෙක් වතුරෙන්ද, ආත්මයාණන්ගෙන්ද, නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙන්ට බැරිය".
(යොහාණ් 3:5)

පේදුරු :-

"නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව් කමාව පිණිස යේසුස්ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බෞතිස්මය ලබාපල්ලා... එකල ඔහුගේ වචනය පිළිගත් අය බෞතිස්ම කරණු ලැබුවෝය... ඔවුහු ප්‍රේරිතයන්ගේ ඉගැන්වීමෙහිද, සහභාගිකමෙහිද, රොටි කැඩීමෙහිද, යාච්ඤා වලද ස්ථිර ලෙස පැවතුණාහ". (ක්‍රියා 2:28,41,42)

පාවුල් :-

"ක්‍රිස්තුස්වහන්සේ තුලට බෞතිස්ම ලැබුවාවූ අප සියල්ලන් උන්වහන්සේගේ මරණයට බෞතිස්ම ලැබූ බව, අපිත්....... මරණය තුළට බෞතිස්මය කරනකොටගෙන උන්වහන්සේ සමග තැන්පත් කරනු ලැබුවෙමු". (රෝම 6:3,4)

බයිබලයේ, බෞතිස්මය යනු ජලයේ තැන්පත් කිරීමකි. ක්‍රිස්තුස්වහන්සේ සමග නැවත නැගිටීමකින් ආරම්භ කිරීමට, කුරුසගතවී ඔවුන්ගේ පැරණි ජිවිත භූමදාන කිරීමට පාපොච්චාරනය කල අය විසින් භාරගත් දෙයකි.

## <u>ක්‍රිස්තියානි ජීවිතය</u>

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

යේසුස්වහන්සේගේ ජිවන රටාව අනුගමනය කිරීමට, උන්වහන්සේගේ අණපනත් ඉටු කිරීමට, උන්වහන්සේගේ මරණය සිහි කිරීමට, ලෝකයෙන් නොකැලැල්ව සිටීමට උවමනා වියයුතු වෙමු.

යේසුස්වහන්සේ :-

"නුඹලා මට ප්‍රේම කරනවා නම් මාගේ ආඥා රක්ෂාකරන්නහුය". එකිනෙකාට ප්‍රේමකරපල්ලාය කියා අලුත් ආඥාවක් මම නුඹලාට දෙමි". (යොහාන් 14:15, 13:34)

"නුඹේ කඩුව කොපුවේ දමාපන්න. මක්නිසාද කඩු ගන්න සියල්ලෝ කඩුවෙන්ම විනාශවන්නෝය". (මතෙව් 26:52)

යොහාන් :-

"ලෝකයටත් ලෝකයෙහි තිබෙන දේවලටවත් ප්‍රේම නොකරල්ල..... ලෝකයෙහි තිබෙන සියල්ල එනම්, මාංසයේ තෘෂ්ණාවත්, ඇස්වල තෘෂ්ණාවත්, ජිවිතයේ අහංකාර කමත් පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ".
(යොහාන් 2:15 - 16)

පාවුල් සහ යේසුස්වහන්සේ :-

"මක්නිසාද මම නුඹලාට භාරදුන් දේ ස්වාමින්වහන්සේගෙන් ලැබීමි. එනම් ස්වාමි වූ යේසුස්වහන්සේ පාවාදෙනු ලැබූ රාත්‍රියේදී උන්වහන්සේ රොටි රැගෙන, ස්තුති කොට කඩා මෙය නුඹලා උදෙසා දෙන්නාවූ මාගේ ශරීරයය. මා සිහි කිරීම පිණිස මෙය කරපල්ලා යයි කීසේක. එලෙසම රාත්‍රි කෑමෙන් පසු කුසලානක්දී, මේ කුසලාන මාගේ ලෙයින් පිහිටුවන අලුත් ගිවිසුමය. යම් පමණ වර නුඹලා මෙයින් බොන්නහුද, එපමණ වර මා සිහිකිරීම පිණිස මේක කරපල්ලා යැයි කී සේක. මක්නිසාද, නුඹලා යම් පමණ වරක් මේ රොටි කන්නහුද, කුසලානෙන් බොන්නහුද, එපමණ වරක් ස්වාමින්වහන්සේ එන තුරු නුඹලා උන්වහන්සේගේ මරණය ප්‍රකාශ කරන්නහුය".
(1 කොරින්ති 11:23-26)

එම නිසා, නිතිපතා පූප කෑඩීමටත් උන්වහන්සේ සිහි කිරීමටත්, සෑම විටම උන්වහන්සේගේ පැමිණීම ගැන බලාපොරොත්තුවෙන් සිටීමටත් බයිබලය සැබෑ ක්‍රිස්තියානිකාරයෝ උනන්දු කරනවා ඇත.

## නැවත නැගිටීම සහ විනිශ්චය

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

ආශිර්වාද හෝ ගර්හා ලැබීමට, අපේ විනිෂ්චය කරුවාවූ යේසුස්ක්‍රිස්තුස් වහන්සේ ඉදිරියේ එක් දිනෙක අප සිටිය යුතු බැව් දැනගත යුතු වෙමු:

යේසුස්වහන්සේ :-

"මනුෂ්‍යයන් කියන්නාවූ සියලූ නිෂ්ඵල වචන ගැන විනිෂ්චය දවසේදී උත්තර දෙන්ට වෙන්නේ යයි නුඹලාට කියමි. මක්නිසාද නුඹේ වචන වලින් නුඹ වරදට පත්කරනු ලබන්නෙහිය". (මතෙව් 12:36,37)

පාවුල් :-

"මක්නිසාද එකිනෙකා තම තමාගේ ශරීරයේදී කළාවූ දේවල් වල, ඒ දේ යහපත් වුවත්, කළ දේවල් හැටියට ලබන පිණිස, අප සියල්ලෝම ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියෙහි ප්‍රකාශ වෙන්ට ඕනෑය". (2කොරින්ති 5:10)

දානියෙල් :-

"පොළවේ ධූලියෙහි සැතපෙන්නන් බොහෝ දෙනෙක්, සමහරෙක් සදාකාල ජීවනයටත්, සමහරෙක් නින්දාව සහ සදාකාල නිවකමටත්, පිබිද එන්නෝය". (දානියෙල් 12:2)

යේසුස්වහන්සේ :-

"ඔබගේ උදහසද මලවුන් විනිශ්චය කරන කාලයද ඔබ ස්වකීය මෙහෙකරුවූ ප්‍රොපේතතවරුන්ටත් ශුද්ධවන්තයන්ටත් ඔබගේ නාමයට භයවන ලොකු කුඩා තැනැත්තන්ටත් විපාක දෙන්නාවූ, පොලව විනාශ කරන්නාවුන් විනාශකරන්නාවූ කාලයද පැමිණුනේය. (එළිදරව් 11 :18)

පාවුල් :-

"ධර්මිෂ්ඨයන්ගේද, අධර්මිෂ්ඨයන්ගේද නැවත නැගිටීමක් වන්නේය.... ඔහු ධර්මිෂ්ඨකමද, පමණ දැන ක්‍රියා කිරීමද, පැමිණෙන්නාවූ විනිශ්චයද ගැනද කතා කරද්දී පිලික්ස් බියපත්ව". (ක්‍රියා 24:15,25)

පේදුරු :-

"ඔවුන් විසින් පිවතුන්ද මලවුන්ද විනිශ්චය කරන්ට සූදානම්ව සිටින තැනැන්වහන්සේට ගණන් දෙන්නට වෙනවා ඇත". (1පේදුරු 4:5)

දෙවියන්වහන්සේට තම යුතුකම තේරුම්ගත් අය, ඔවුන් එය තේරුම් ගෙන විශ්වාසයෙන් කීකරුවී සිටියත්, එය ප්‍රතික්ෂේප කළ හෝ මගහැරියා හෝ අය, ආශිර්වාදය හෝ ප්‍රතික්ෂේපය ලැබීමට ස්වාමින්වහන්සේගේ විනිශ්චය ඉදිරියේ සිටිය යුතුය.

යේසුස්වහන්සේ :-

"මනුෂ්‍ය පුත්‍රයා සියලු දේවදූතයන් සමග තමන්ගේ තේජසින් එන කළ, ස්වකීය තේජසේ සිංහාසනයෙහි වැඩ හිඳින සේක. එවිට සියලු ජාතිහු උන්වහන්සේ ඉදිරියට රැස්කරනු ලබන්නෝය. උන්වහන්සේ එඬේරෙකු විසින් එළුවන් කෙරෙන් බැටළුවන් වෙන් කරන්නාක් මෙන් ඔවුන් වෙන්කොට, බැටළුවන් තමන්ගේ දකුණු පැත්තේද එළුවන් වම් පැත්තේද සිටුවන සේක. එවිට රජ්ජුරුවෝ තමන්ගේ දකුණු පැත්තේ සිටින්නන්ට කියන සේක්, මාගේ පියාණන්ගෙන් ආශිර්වාද ලද්දෙනි, වරෙල්ලා ලෝකය පටන්ගැන්මේ සිට නුඹලාට සූදානම් කර තිබෙන රාජ්‍යය උරුමකර ගනිල්ලා..... එවිට උන්වහන්සේ වම් පැත්තේ සිටින්නන්ට කියනසේක්, ශාපලද්දෙනි, මා කෙරෙන් පහව යක්ෂයාටත් ඔහුගේ දූතයන්ටත් සූදානම් කර තිබෙන සදාකාල ගින්නට පලයල්ලා". (මතෙව් 25:31-41)

"ඇස්දෙක ඇතුව නිරයේ හෙලනු ලැබීමට වඩා එක ඇසක් ඇතිව දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීම නුඹට හොඳය". (මාර්ක් 9:43-48)

# මහිමාන්විත අවසානය

අපි ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරනවා යැයි පවසන්නේ නම්

ක්‍රිස්තුස්වහන්සේගේ ක්‍රියාවෙන් සර්ව සම්පූර්ණවූ, දෙවියන් වහන්සේගේ මහිමයෙන් පිරුනාවූ පෘතුවියේ කාලය දෙස බලා සිටිය යුතු වෙමු.

මෝසෙස් හට :-

"මා ජීවත්ව සිටිනවාත් මුළු පොළව ස්වාමින්වහන්සේගේ තේජසෙන් පූර්ණ කරනු ලබනවාත් සැබෑසේම". (ගණන් කථාව 14:21)

ගීතාවලිය :-

"දෙවියන්වහන්ස, රජ්ජුරුවන්ට ඔබගේ විනිශ්චයද රාජ පුත්‍රයාණන්ට ඔබගේ ධර්මිෂ්ඨකමද දුන මැනව. උන්වහන්සේ ඔබගේ සෙනඟ ධර්මිෂ්ඨකමින්....... විනිශ්චයකරන්නෝය".

ආශ්චර්ය කිරීමේ එකම කර්තෲවූ දානියෙල්ගේ දෙවිවූ, ස්වාමිවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා. උන්වහන්සේගේ ශ්‍රීමත් නාමයට සදාකල් ප්‍රශංසා වේවා. මුලු පොළව උන්වහන්සේගේ මහිමයෙන් පිරේවා". (ගීතාවලිය 72:1,18,19)

යොසායා :-

"මාගේ ශුද්ධ කන්දේ සීමා තුලෙහි කිසි අනතුරු කිරීමක්වත්, විනාශ කිරීමක්වත් නොවන්නේය මක්නිසාද ජලයෙන් මුහුද වැසී තිබෙන්නාක්මෙන්, ස්වාමින්වහන්සේගේ දැනගැන්මෙන් පොළව පිරී යන්නේය". (යෙසායා 11:19)

හබක්කුක් :-

"මක්නිසාද ජලයෙන් මුහුද වැසී තිබෙන්නාක් මෙන් ස්වාමින්වහන්සේගේ තේජස දැනගැන්මෙන් පොළව පිරී යන්නේය". (හබක්කුක් 2:14)

පාවුල් :-

"උන්වහන්සේ සියලු අධිපතිකම්ද බලයද පරාක්‍රමයද නැතිකල කල්හි, උන්වහන්සේ රාජ්‍යය පියවූ දෙවියන්වහන්සේට භාරදෙන සේක. මක්නිසාද උන්වහන්සේ සියලු සතුරන් තමන් වහන්සේගේ පාද යට දමන තුරු රජකම් කරන්ට ඕනෑය. නැති කරනු ලබන්නාවූ අන්තිම සතුරා නම් මරණයය".
(1 කොරින්ති 15:24-26)

යේසුස්වහන්සේ :-

"මරණයත්, පාතාලයත් (සොහොන) ගිනිවිලට හෙලන ලද්දේය". "මෙන්න දෙවියන්වහන්සේගේ මණ්ඩපය මනුෂ්‍යයන් සමගය. උන්වහන්සේ ඔවුන් සමග වාසය කරන සේක. ඔවුහු උන්වහන්සේගේ සෙනඟ වන්නෝය. දෙවියන්වහන්සේම ඔවුන් සමග සිට ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන සේක. උන්වහන්සේ ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුලු පිසදමන සේක. මරණය තවත් නොවන්නේය, වැලපීමත් හැඬීමත්, වේදනාවත් තවත් නොවන්නේය. මක්නිසාද පළමු දේවල් පහව ගියේය".
(එළිදරව් 20:14, 21:3,4)

එසේ, දෙවියන්වහන්සේගේ සියලු සත්‍ය සාන්තුවරයන් මධ්‍යයේ, මැවීමේ ක්‍රියාවලියේ අභිප්‍රාහිත සම්පූර්ණත්වය අවසානයේදී ප්‍රත්‍යක්ෂවීම බයිබලය පෙන්වයි.